# 1.20 උඩරට වෙස් ඇඳුම් කට්ටලය නිර්මාණය වීම කෙරෙහි බලපෑ හේතු සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී.අයි.වයි. රංගනාත්

දෘශ්‍ය කලා සැලසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

දේශීය ගැමි යාතුකර්ම අතර ප්‍රධාන ශාන්තිකර්මයක් වශයෙන් සැලකෙන උඩරට නර්තන සම්ප්‍රදායට අයත් කොහොඹා යක් කංකාරියේ නර්තනයේ යෙදෙන යක්දෙස්සාගේ ඇඳුම් කට්ටලය වෙස් ඇඳුම් කට්ටලය යන නමින් හැඳින්වේ. නර්තනයෙහි ප්‍රාසාංගික බව තීව්‍ර වන ලෙසත්, නර්තකයාගේ ප්‍රතාපවත් භාවය ප්‍රදර්ශනය වන ලෙසත් සකස් වී ඇති මෙම වෙස් ඇඳුම් කට්ටලය වර්තමානය වන විට උඩරට නර්තන සම්ප්‍රදායේ නළු ඇඳුම් කට්ටලය ලෙසින් ස්ථාපිත වී ඇත. මෙම ඇඳුම් කට්ටලය මලය රජුගේ වේෂය නිරූපණය කරන බව කොහොඹා යක් කංකාරියේ මහායාතිකාව හෙවත් අයිලය යැදීමේ දී ප්‍රකාශ වේ. මෙම ඇඳුම් කට්ටලය රජ ඇඳුමක් බව ජේ. ඊ. සේදරමන් ප්‍රකාශ කරයි ජී. රංගනාත්ගේ අදහස එය සූර්යාගේ සංකේතයක් බවයි. මහායාතිකාවේ දැක්වෙන අදහසම තහවුරු කරන චාල්ස් ගොඩකුඹුර එය මලය රජුගේ ඇඳුම් කට්ටලයම බව පවසයි.

මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරනුයේ, ඓතිහාසික මූලාශ්‍රය හා ජනශ්‍රැති ඇසුරු කොට ගනිමින් පූර්වෝක්ත අර්ථ කථන පිළිබඳ ශාස්ත්‍රීය විග්‍රහයක් කිරීමයි.